ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
යුද්ධ හමුදාව සිය කාර්ය මණ්ඩලය 1,586 ක්, වාහන 115 ක්, ඉන්ධන ලීටර් 83,277 ක්, වර්ග අඩි 249,074 ක ගොඩනැගිලි, ඉඩම් අක්කර 113 රූඩ් 2 පර්චස් 36 ක් සහ වෙනත් වත්කම් අයිතම 1,013 ක් ඇතුළු යුද්ධ හමුදා සම්පත් භාවිතාකර දිවයිනේ විවිධ ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන යුද්ධ හමුදා ගොවිපලවල් 18 ක්, සුහසාධන හෝටල් 05 ක් ඇතුළු විවිධ ආදායම් උත්පාදන ව්‍යාපෘති තුලින් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1,357.6 ක ආදායමක් උපයා තිබුණද, මෙම ආදායම් මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි.	එක් එක් ආදායම් උත්පාදන ඒකක මඟින් වාර්තා කරනු ලබන ආදායම් නිසි පරිදි මූල්‍ය ප්‍රකාශයෙහි "වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කළ ආදායම්" ලෙස දක්වා ඇති බව.	ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන ආදායම පමණක් නොව යථෝක්ත ව්‍යාපෘති තුලින් උපයන සමස්ථ ආදායම මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම.

(ආ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ඉන්ධන වියදම රු.මිලියන 6,959.9 ක් වූ අතර, ඉන්ධන පිරවුම්හල් වලින් සිදු කරන ලද ඉන්ධන වියදම රු.මිලියන 5,591.3 ක් වූයෙන් රු.මිලියන 1,368.6 ක වෙනසක් පැවතුණි. තවද, ඉන්ධන පිරවුම්හල් වලින් සමාලෝචිත වර්ෂයේ ඉන්ධන ලීටර් 16,989,832 ක් නිකුත් කර තිබුණද, විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව එය ලීටර් 14,414,043 ක් වූ අතර, වාහන ලොග් සටහන් පොත් අනුව සමාලෝචිත වර්ෂයේ ඉන්ධන ලීටර් 13,704,653 ක් භාවිතා කර තිබුණි.	තොරතුරු ඉදිරිපත් කිරීමේදී ඇතැම් යුද්ධ හමුදා ආයතනයන්ගේ විස්තර ඉදිරිපත්කර නොතිබීම සහ මුදල් පදනම මත, ගෙවීමේ පදනම මත හා වැය ශීර්ෂ හුවමාරු පදනම මත ඉන්ධන නිකුත් කිරීම සබැඳිව විස්තර ඇතුළත් නොමැති බව.	ඉන්ධන නිකුත් කිරීමේ වටිනාකම හා ප්‍රමාණාත්මක සංඛ්‍යා අතර ඇති පරස්පරතා වලින් තොරව තොරතුරු ඉදිරිපත් කළයුතු වීම.

(ඇ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1220.53 ක් වූ මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ අත්පත් කරගැනීමේ වියදම, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) රු.මිලියන 136.77 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මූලධන වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම.
ii.	විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන අයිතම 10 ක නොනිමි වැඩ ශේෂය රු.මිලියන 177.90 ක් වැඩියෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දක්වා තිබුණි.	නිමි/නොනිමි වැඩ නිවැරදිව හඳුනාගෙන වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව.	මූලධන වියදම් හා නොනිමි වැඩ නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.
iii.	පෙර වර්ෂවල සිට අවිච්ඡින්නව පැවති ඉදිකිරීම්/ නවීකරණවලින් කොටසක් ඇතුළුව සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද වටිනාකම රු.මිලියන 189.91 ක් වූ අතර, වර්ෂය අවසානයේ මෙම වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරනු ලබන බව.	අදාළ වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතු වීම.

(ඈ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) ඇතුළත් වත්කම් වර්ග 29 ක පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගැනීමේදී රු.මිලියන 7,880.09 ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධතාවයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වටිනාකම් නොසැසඳීමට හේතුව මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම.
ii.	2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,116.06 ක කෙරීගෙන යන වැඩ විවිධ වත්කම් අයිතම 24 ක් යටතේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ එම අගයන් වත්කම් අයිතම 07 යටතේ පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි.	ඉදිරියේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන නිවැරදි වත්කම් කේත යටතේ ඇතුළත් කරන බව.	නිවැරදි වත්කම් කේත යටතේ වටිනාකම් අනාවරණය කළ යුතු වීම.

iii.	යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට පරිහරණය කරමින් පැවති දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි යුද්ධ හමුදාවට අයත් බිම් කැබලි 97 ක් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.	තක්සේරු වාර්තා ලැබීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	මෙම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වීම.
iv.	සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවට විවිධ පාර්ශවයින්ගෙන් ලද රු.මිලියන 15.95 ක් වටිනා ධාවනයට නුසුදුසු වාහන 09 ක්ද මූල්‍ය නොවන වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.	මේ වන විට අයෝග්‍ය තත්වයේ පවතින මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
v.	2019 නොවැම්බර් 08 දින සිට මේ දක්වා භාවිතා කරනු ලබන වර්ග මීටර් 94,000 ක් වූ හමුදා මූලස්ථාන ගොඩනැගිල්ලද, 2021 වර්ෂයේ රු.මිලියන 101 ක් වැයකර මිලදී ගත් Oracle පරිගණක මෘදුකාංගයද, 2023 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ කෘෂි කාර්මික හා සත්ත්ව පාලන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 50.20 ක ප්‍රාග්ධන අයිතමයන් මිලදී ගැනීම හා වාහන 34 කට සිදුකළ එකතුව රු.මිලියන 60.88 ක ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියා වියදම්ද, ප්‍රාග්ධනිත කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රාග්ධනිත කළ යුතු වීම.
vi.	සමාලෝචිත වර්ෂයේ නොනිම් වැඩ ලෙස ප්‍රාග්ධනිත කළ යුතු රු.779,397 ක වත්කම් වෙනත් ආකෘති (Other Structure) යටතේද, රු.මිලියන 2.01 ක් වටිනා ප්‍රවාහන උපකරණ මිලදී ගැනීමකින් තොරවද, අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව රජයේ හා පෞද්ගලික අංශයෙන් 1995 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පරිත්‍යාග වශයෙන් ලද රු.මිලියන 71.85 ක වටිනාකමක් ඇති වාහන 14 ක්ද ප්‍රාග්ධනිත කර තිබුණි.	2025 වර්ෂයේදී අදාළ ගිණුම් ශේෂ නිවැරදි කිරීම කරනු ලබන බව හා අදාළ වාහනවල අයිතිය යුද්ධ හමුදාව වෙත පවරා ගෙන ගිණුම්ගත කරන බව.	හිමිකම තහවුරු කළ හැකි වත්කම් පමණක් නිවැරදි ක්ෂේත්‍ර යටතේ ප්‍රාග්ධනිත කළ යුතු වීම.
vii.	විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ-6) සමාලෝචිත වර්ෂය අවසානයට නොනිම් වැඩ ශේෂය රු.මිලියන 828.36 ක් වැඩියෙන් දක්වා තිබුණි.	කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	නිවැරදි වටිනාකම් පමණක් ගිණුම්ගත කළ යුතු වීම.

viii.	සමාලෝචිත වර්ෂය තුළ යුද්ධ හමුදාව විසින් අපහරණය කිරීමට පෙර රු.මිලියන 44.32 ක් වටිනා වාහන 51 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙන් ඉවත්කර ඇති අතර, එම වාහන 2025 ජනවාරි මාසයේ රු.මිලියන 14.30 කට අලෙවිකර තිබුණි.	ටෙන්ඩර් ක්‍රියාවලියේ ඇතිවූ ප්‍රමාදයන් මෙම තත්ත්වයට හේතු වී ඇති බව.	වත්කම් ඉවත්කිරීමේදී ලේඛනගත කිරීම නිවැරදිව සිදු කළ යුතු වීම.

(ඉ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුද්ගලික ආයතනයක් සමඟ 2024 අප්‍රේල් 01 දින ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව 2024 දෙසැම්බර් 10 දින රු.මිලියන 7.5 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇති අතර, එම අත්තිකාරම් මුදලින් වර්ෂය තුල ආවරණය නොවූ දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙවූ රු.මිලියන 5 ක මුදල අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.	ඉදිරියේදී එම වටිනාකම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව.	ගිණුම් තුලින් යාවත්කාලීනවූ නිවැරදි තොරතුරු හෙළිදරවු කළ යුතු වීම.

(ඊ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

යුද්ධ හමුදාව විසින් මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව මාසික වාහන ලොග් පත්‍රිකා සහ ඉන්ධන වැය කිරීමේ වාර්තා යාවත්කාලීන කර නොතිබුණි.

(උ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජනවාරි 01 දිනට ආරම්භක කෙරීගෙන යන වැඩ ශේෂයට කරන ලද රු.මිලියන 7,116.06 ක ගැලපීම් අතරින් රු.මිලියන 418.75 ක ගැලපීම් තහවුරු කර ගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	CIGAS පද්ධතියේ දෝෂයක් මත වූ බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ එක්ව නිවැරදි කරන බව.	වටිනාකම් තහවුරු කර ගැනීමෙන් පසු ගිණුම්ගත කළ යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපව පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	ආදායම් උත්පාදන ව්‍යාපෘති තුළින් ලද ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළින් ආනාවරණය කර නොතිබුණි.	1.6.1(අ)
1.6.1.(ඇ)(iv)	ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා මිලදී ගත් වත්කම් ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කර නොතිබුණි.	1.6. 1(ඇ) (v)
2.3(අ)	බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළින් ආනාවරණය කර නොතිබුණි.	3.3 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යුද්ධ හමුදාව විසින් අදාළ ක්ෂේත්‍ර පිළිබඳ නිසි අවධානය යොමු කරමින් ආදායම් ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් ආදායම් උත්පාදන ව්‍යාපෘති තුළින් සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත ආදායම රු.මිලියන 1,080.34 ක් දක්වා තිබුණද, රු.මිලියන 1,357.64 ක සත්‍ය ආදායමක් උපයා තිබුණි.	රටේ පවතින ආර්ථික ප්‍රතිපත්ති, කාලගුණික බලපෑම හා වෙනත් සාධක මත ආදායම් පුරෝකථනය වෙනස් විය හැකි බව.	ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	සමාලෝචිත වර්ෂයේ සාම සාධක මෙහෙයුම් රාජකාරි මඟින් රු.මිලියන 1,212.53 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, 2023 වර්ෂයේ අවසන් අර්ධ වර්ෂයට අදාළව රු.මිලියන 548.58 ක් ද, 2024 වර්ෂයේ මුල් අර්ධ වර්ෂයට අදාළව රු.මිලියන 739.26 ක් ද වශයෙන් ආදායම් උපයා සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගෙන තිබුණි.	එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ගෙවීම් සිදුකරනු ලබන්නේ කාර්තු දෙකක පමණ ප්‍රමාදයකින් වන බැවින් ඉහත ගැටළුව සෑම වර්ෂයකම උද්ගත වන බව.	අවබෝධතා ගිවිසුම් මත නියමිත පරිදි අදාළ දීමනාවන් ඉල්ලුම් කිරීමට කටයුතු කළ යුතු වීම.

3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් එකොළහකට සහ මූලධන වැය විෂයකට සලසා තිබුණු	2024 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව	ඇස්තමේන්තු හැකිතාක් දුරට

	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මුදල් රෙගුලාසි 66 යටතේ රු.බිලියන 13.37 ක් වෙනත් වැය විෂයන් වලින් මාරුකරගෙන තිබුණු අතර, එසේ අමතර ප්‍රතිපාදන සලසා ගැනීම එම වැය විෂයන්හි ඇස්තමේන්තුගත වියදමට වඩා සියයට 16 සිට 74 දක්වා වූ පරාසයකින් යුතුව යුක්ත විය. ප්‍රතිපාදන මාරු කරන ලද වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු පිලියෙල කිරීමේදී අධි වටිනාකම් සහිතව පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.	වෙතින් ඉල්ලුම්කළ සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබුණු බැවින්, වෙන්කර දුන් ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බැවින්, ප්‍රතිපාදන මාරුකර ගන්නා ලද බව.	නිවැරදිව පිළියෙළ කර, අනුමත ඇස්තමේන්තු සීමාව තුළ කටයුතු කළ යුතු වීම.
(ආ)	222-01-01-1205 (වෙනත්) වැය විෂයෙන් නිශ්චිතව හඳුනාගත නොහැකි වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කළ යුතු වුවත්, ඇස්තමේන්තු සකස් කිරීමෙදි නිශ්චිතව හඳුනාගත හැකි වැය විෂයන් සඳහා රු.මිලියන 3,514.90 ක් ද සහිතව රු.මිලියන 4,040 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.මිලියන 2,114.38 ක වියදම් කර තිබුණු අතර, රු.මිලියන 1,925 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් සඳහාද මාරු කිරීමට කටයුතු කර තිබුණි. තවද, උක්ත වැය විෂයෙන් රු.මිලියන 2,281.90 ක් සංචිත හා පුපුරණ ද්‍රව්‍ය සඳහා වෙන්කර තිබුණු අතර පුපුරණ ද්‍රව්‍ය සඳහා රු.මිලියන 478.97 ක් වැයකර තිබුණි.ඒ අනුව වෙනත් කාර්යන් සඳහා වියදම් වෙනුවෙන් මෙම වැය විෂයෙන් ප්‍රතිපාදන වෙන් කර තබාගෙන තිබුණි.	ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ලබාදී ඇති ප්‍රතිපාදන යුද්ධ හමුදාවේ අවශ්‍යතාවමත කළමනාකරණය කළයුතු බැවින්, කාලානුරූපීව ඇතිවිය හැකි විවිධ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන සලසාගැනීම අපහසු බැවින් හා යුද්ධ හමුදාව වෙත වෙන්කරදෙනු ලබන ප්‍රතිපාදන තුළින් එම අවශ්‍යතාවන් කළමණාකරණය කර ගන්නා බව.	ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා තාත්විකව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු වීම.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 1,978.39 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු සටහන් අංක iii යටතේ ඉදිරිපත් කර නොතිබුණි.	අත්‍යාවශ්‍යයෙන් දැරීමට සිදුවන වියදම් බැවින් සටහන් අංක 07 මගින් ඉදිරිපත් කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි අගයන් ඉදිරිපත් කළ යුතු වීම.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම් අනුව යුද්ධ හමුදාව එම සංස්ථාවට රු.මිලියන 290.84 ක් ගෙවිය යුතු වුවත්, යුද්ධ හමුදාවේ බැරකම් වාර්තාව අනුව එම අගය රු.මිලියන 40.08 ක් වූයෙන් රු.මිලියන 250.76 ක් අඩුවෙන් වාර්තා කර තිබුණි.	2024 වර්ෂයට අදාළව නිරවුල් කර යුතුව තිබූ ඉතිරි ශේෂය ඇතුළුව රු.මිලියන 250.76 ක වටිනාකම 2025 වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතුකර ඇත.	ප්‍රවර්ථන වර්ෂයේ වියදම් එම වර්ෂයේ පියවීමට හැකි සෑම විටම කටයුතු කිරීම.

3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂය 126-02-03-02-2001-11 ට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසලක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ රු.මිලියන 10.47 ක මුළු ප්‍රතිපාදනයම වැයකර තිබූ නමුත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 55 ක් පමණක්ව පැවතුණි.	අනුමත ප්‍රතිපාදන සීමාව තුළ අවශ්‍ය අමුද්‍රව්‍ය සපයාගෙන ඇති අතර, අනුමත කාලසීමාව තුළ සේවාව අවසන් කිරීමට සැලසුම්කර ඇති බව.	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කළ යුතු වීම.

3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.11 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය මේ සඳහා ලිපියක් ඉදිරිපත් කර ඇති බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ආ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.4 හා 4.8 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	මෙම අඩුපාඩු මඟ හරවා ගැනීම සඳහා නව අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී ඇති බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනා කම රු.**	**අනුකූල නොවීම**		
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
i.	මුදල් රෙගුලාසි 214		යුද්ධ හමුදාව විසින් දිනපතා යාවත්කාලීන කරනු ලබන බැරකම් ලේඛනයක් පවත්වා නොගැනීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළැඹී තිබුණි.	පරිගණකගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්නා ගැනීමට කටයුතු කළ යුතු වීම.
ii.	මුදල් රෙගුලාසි 511(අ) සහ 513(ආ)		අත්තිකාරම් ගිණුම් කටයුතුවල අපේක්ෂිත කාරක පාඩු පියවීම සඳහා වාර්ෂික ඇස්තමේන්තු වලින් ප්‍රතිපාදන වෙන් නොකරන ලද වැය විෂය 222-01-01-1701 සඳහා මුදල් රෙගුලාසි 66 අනුව රු.මිලියන 3.53 ක් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.	ඉදිරි වර්ෂ සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ දී සාධාරනීකරණය කළහැකි ඇස්තමේන්තු වටිනාකමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	වාර්ෂික ඇස්තමේන්තු තුලින් ප්‍රතිපාදන සලසා ගත යුතු වීම.
iii.	මුදල් රෙගුලාසි 1646		සමාලෝචිත වර්ෂයේ මැයි මාසයට අදාළව වාහන 6,540 ක මාසික සාරාංශය සහ දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොමැති අතර, වාහන 2727 කට ලබා දී ඇති උක්ත වාර්තා මාස 02 සිට මාස 07 ක් දක්වා ප්‍රමාද කර තිබුණි.	ඉදිරියේදී නියමිත පරිදි මාසික ධාවන සාරාංශ හා මාසික වාහන ලොග් පත්‍රිකා ඉදිරිපත් කිරීමට හැකිවන ලෙස සූදානම්කර තැබීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව.	මාසික ධාවන සටහන් සාරාංශ වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කිරීම.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
i. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය	නිසි ඉන්ධන පරීක්ෂාවක් සිදු නොකර යුද්ධ හමුදාව විසින් වාහන 2,324 ක් පරිහරණය කර තිබුණි.	2025 මුල් මාස 4 තුළ වාහන 759 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර ඇති බව.	වාර්ෂික ඉන්ධන පරීක්ෂාව සිදු කළ යුතු වීම.
ii. 1989 මාර්තු 23 දිනැති අංක 19/89, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛ	සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ 8,325 ක් වූ සමස්ත කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා නොකර වැටුප්, දීමනා හා අතිකාල ගෙවා තිබුණි.	මූලික පියවර ලෙස ඔරුගොඩවත්ත හා යුහරෝ(කොළඹ) කාර්යාලයන්හි ස්ථාපිත කර ඇති අතර, ඉතිරිය කඩිනමින් සිදු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතයට කටයුතු කළ යුතු වීම.
(ඇ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ			
ජා.ප්‍ර.නි චක්‍රලේඛ අංක 08 හි 9.3.1(ආ) මාර්ගෝපදේශය සහ 2021 අප්‍රේල් 21 දින සංශෝධන	සමාලෝචිත වර්ෂය තුල යුද්ධ හමුදාවට විසින් රු.මිලියන 448.93 ක් වැයකර වාහන 246 ක් අලුත්වැඩියා කිරීමේදී රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	අනුමැතිය ලබාගෙන නොමැති බව.	අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ගත යුතු වීම.
(ඈ) ජාතික අයවැය චක්‍රලේඛය			
2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය	විදේශීය අනුග්‍රාහක ආයතනය විසින් පූර්ණ පිරිවැය නොදරන ලද විදේශ අධ්‍යාපන/ පුහුණු/ සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා නිලධාරීන් සහභාගී කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 334.9 ක් වැයකර තිබුණි.	2024 වර්ෂයේ විදේශ පාඨමාලා මිලදීගැනීම සඳහා කිසිදු පිරිවැයක් දරා නොමැති අතර, අත්‍යවශ්‍ය දීමනා සඳහා පමණක් ගෙවීම් සිදුකර ඇති බව.	අනුග්‍රාහක ආයතනය විසින් පූර්ණ පිරිවැය නොදරන විදේශ පුහුණු සඳහා වියදම් නොදැරිය යුතු වීම.
(ඉ) කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය චක්‍රලේඛය			
2022 සැප්තැම්බර් 09 දිනැති 10/2022 හා 2023 ජනවාරි	2024 මාර්තු හා අප්‍රේල් මාසයන්හිදි අපහරණය කළ යුතු යැයි මණ්ඩල වාර්තා	වාහන 47 ක් අපහරණය කර මුදල් ඒකාබද්ධ අරමුදල	වාහන අපහරණය සඳහා

	30 දිනැති 03/2023 වත්කම් කළමනාකරණ චක්‍රලේඛ	මඟින් හඳුනා ගෙන තිබුණු, 2015 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර ඇති පිරිවැය රු.මිලියන 49.34 ක් වටිනා වාහන 24 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙත බැර කර ඇති අතර, වාහන 24 නිෂ්කාශන ගැටළු හේතුවෙන් අලෙවි කිරීමට නොහැකි වී ඇති බව.	කඩිනමින් කටයුතු කළයුතු වීම.
(ඊ)	**2006 අංක 10 දරන පෙර දේශීය ආදායම් පනතට හා එම පනතට 2022 දෙසැම්බර් 28 දිනැති අංක 2312/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සිදු කරන ලද සංශෝධන**			
i.	2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01, 2023 අප්‍රේල් 06 දිනැති අංක SEC/2023/E/02 හා 2023 ජුලි 18 දිනැති අංක SEC/2023/02 චක්‍රලේඛයන්	අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේදී මූල්‍යමය හා මූල්‍යමය නොවන ප්‍රතිලාභ මත නිලධාරි 1,536 දෙනෙකුගේ වැටුපෙන් අඩුකළ යුතු රු.මිලියන 112.24 ක බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි.	මේ සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කර ඇති මණ්ඩල වාර්තාව ලැබීමෙන් පසු සුදුසු පරිදි ක්‍රියාකරන බව.	නිවැරදි බදු වටිනාකම ප්‍රේෂණය කළ යුතු වීම.
ii.	2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01, 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතේ 05 වන වගන්තිය හා 2015 ජුලි 06 දිනැති අංක SEC/2015/05 දරන දේශිය ආදායම් චක්‍රලේඛයේ 4 ඡේදය	බදු නිදහස් ආදායම් ප්‍රභවයන්ට ඇතුළත් නොවන ආරක්ෂක හමුදා සඳහා ලබා දී ඇති නිල ඇඳුම් නඩත්තු, සළාක, සහය හා දුෂ්කර යන දීමනා බද්දට යටත් නොවන සේවානියුක්තීන් උපයන ලාභ ලෙස සලකා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කර තිබුණි.	ආරක්ෂක අමාත්‍යාංශය හා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙතින් ලබාදෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	බදු වටිනාකම නිවැරදිව ගණනය කළ යුතු වීම.

3.7 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාර බලය නොමැති ගෙවීම්

යුද්ධ හමුදාව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගෙවීම කර තිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 දෙසැම්බර් 19 දිනැති අංක MOD/DEF/GS/M/32(53) දරන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (ආරක්ෂක) ලිපිය ප්‍රකාරව සේවා, සේවා අභිමාණී හා 75 වන නිදහස් දින සමරු පදක්කම් රාජ්‍ය අරමුදල් භාවිතයෙන් තොර උත්සව අවස්ථා සඳහා අවශ්‍ය ප්‍රමාණය පමණක් ප්‍රසම්පාදනය කර ගන්නා ලෙසත්, 2023 සැප්තැම්බර් 18 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය ප්‍රකාරව උක්ත පදක්කම් මිලදී ගැනීම සඳහා ලංසුකරුවන්ට ප්‍රදානය කිරීමට පෙර ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු බවත් දක්වා තිබුණද, එම නියමයන් ඉක්මවා අදාළ අනුමැතීන් ලබා ගැනීමට පෙර ඇණවුම් නිකුත් කර යුද්ධ හමුදාධිපති අරමුදලින් වැය කරන ලද රු.මිලියන 223.7 ක මුදල යුද්ධ හමුදා වැය විෂයට හර කර තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව මු.රෙ 136 යටතේ වියදම් කිරීම සඳහා ආරක්‍ෂක අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලද අතර, ඒ අනුව ලබාදෙන ලද අනුමැතියට අනුව මෙම පදක්කම් ප්‍රමාණය මිලදී ගැනීමට ඉදිරි කටයුතු සිදුකරන ලදි.	නිසි අනුමැතිය රහිතව රාජ්‍ය වියදමට හර කිරීමේ කමිටු තීරණය සම්බන්ධයෙන් පියවර ගැනීම.

(ii) සහතික නොකළ ගෙවීම්

විධිමත් පරිදි සහතික නොකර පහත සඳහන් ගෙවීම් කර තිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 138.1 සිට 138.9 ප්‍රකාරව විධිමත් අනුමැතියක් නොමැති නිලධාරීන් විසින් සහතික කළ රු.මිලියන 3,925.61 ක වියදම් වැය විෂය 1401(vi) a සහ 1401(vi) b යටතේ ගෙවීම් කර තිබුණි.	විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් යටතේ බලය පැවරීමට කටයුතු කරන බව.	නිසි අනුමැතියක් සහිතව නිලධාරීන් සහතික කළ යුතු වීම.

3.8 වංචනික ස්වරූපයේ ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජුනි, ඔක්තෝබර් හා 2024 ජනවාරි මාස වලදී රු.මිලියන 5 බැගින් හා 2024 මාර්තු මාසයේ රු.මිලියන 3 ක් වශයෙන් එකතුව රු.මිලියන 18 ක මුදලක් වංචනික ලෙස වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශයේ සේවයේ නියුතු නිලධාරියකු විසින් එක් එක් මාසයේ තම වැටුපට එකතු කර වංචනිකව ලබාගෙන තිබුණි.	ඉදිරියේදී මෙවැනි මූල්‍ය වංචා වලක්වා ගැනීම සඳහා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	වංචාව සම්බන්ධයෙන් නෛතික කටයුතු කිරීම හා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
(ආ)	හමුදා සේවයෙන් අස්කිරීම් කටයුතු සඳහා රපෝත්තු කරවා ඇතත් එම කාලසීමාව තුළ හා නිවාඩු නොගෙන සේවයට නොපැමිණි (නිනොනො) කාලය සඳහා ගෙවා ඇති වැටුප් හා දීමනා, එම කාල සීමාවට අදාළ එම අයවලුන්ගේ දෙමාපියන්ට ගෙවා ඇති රණවිරු මාපිය රැකවරණ විශේෂ දීමනාව හා එම අයවලුන්ට ලබා දී ඇති ණය මුදල් ඇතුළුව රු.මිලියන 17.60 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේවා නිරවුල් කරමින් පවතින අතර, පරිගණක මෘදුකාංගය මඟින් නිනොනො අයවළුන්ට වැටුප් හිමි ගැන්වීම නතරවන ආකාරයෙන් පහසුකම් ස්ථාපිතකර පවත්වා ගැනීම.	ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වා ගැනීම.
(ඇ)	යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දෙමාපියන් ජීවත්ව සිටින බව තහවුරු කර ගැනීමකින් තොරව රු.මිලියන 31.23 ක දීමනාවක් ගෙවා තිබුණි.	මාසිකව ජීවත්ව සිටින බවට තහවුරුවන් ලබාගන්නා ලෙස සියළුම රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත උපදෙස් ලබාදී ඇති බව.	ගෙවීම් කිරීමට පෙර ජීවත්ව සිටින බවට වූ තහවුරුව ලබා ගැනීම.

3.9 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල සහ සේවය අතහැරගොස් ඇති හමුදා සහ සිවිල් නිලධාරීන්ගෙන් මෙතෙක් අය කර ගැනීමට අපොහොසත්වූ රු.මිලියන 86.15 ක ආපදා, උත්සව සහ විශේෂ අත්තිකාරම් ණය ශේෂ පැවතුණු අතර, මෙම ණය ශේෂ අතරින් රු.මිලියන 0.55 ක ණය ශේෂ වසර 20 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර අනෙකුත් ණය ශේෂද වසර 01 ත් 20 ත් අතර වන නමුත් මෙම ණය අය කර ගැනීම සතුටුදායක මට්ටමක නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	මෙම හිඟහිටි ණය ශේෂ කඩිනමින් අයකරගත යුතු වීම.

3.10 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව අවිනිශ්චිතව තබාගෙන ඇති ශේෂයන් අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කිරීම හෝ හැකි ඉක්මනින් ගෙවීම් සිදු කිරීම කළ යුතු වුවත් 2023 හා 2024 වර්ෂයට අදාළ රු.මිලියන 6.36 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉතිරිව තිබුණි	මු.රෙ. 571 පරිදි කටයුතු කරන ලෙසට ප්‍රාදේශීය ගණකාධිකාරි කාර්යාල වෙත අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව.	මෙම තැන්පතු ශේෂයන් පියවීමට හෝ රජයේ ආදායමට ගැනීම හෝ කළ යුතු වීම.

3.11 බැංකු ගිණුම් මෙහෙයවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2020 ඔක්තෝබර් 28 දිනැති අංක TD/BE2/4/UNINCOME/ARMY දරන ලිපිය අනුව හමුදා භට පිරිස් විදේශ සාම සාධක රාජකාරිවල නියුතු වීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත විදේශ ව්‍යවහාර මුදලින් (ඇමරිකානු ඩොලර්) ලැබෙන ආදායමෙන් ඇ.ඩො. 1,299,480 ක් ගිණුමේ රඳවාගෙන ඉතිරිය මහ බැංකුවට ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට 2025 පෙබරවාරි දක්වා එම සීමාව ඉක්මවා ඇ.ඩො. 166,877.55 සිට 3,061,238.09 ක් දක්වා වූ පරාසයකින් යුතුව ගිණුමේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි.	එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත කාර්යාලය විසින් තහවුරු කර ගැනීමෙන් පසුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලබන බව.	නියමිත සීමාව ඉක්මවන තැන්පතු මුදල් මහ බැංකුව වෙත ප්‍රේෂණය කළයුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

අලුතින් ඉදි කරන ලද පල්ලේකැලේ යුද්ධ හමුදා මූලික රෝහල සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
i.	මහනුවර ප්‍රදේශයේ හා ඒ අවට ප්‍රදේශවල සේවය කරන හා පදිංචි හමුදා භට පිරිස් 32,000 කට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ප්‍රතිකාර ලබා දීමේ අරමුණින් රු.මිලියන 1,393.62 ක් වැයකර ඉදිකිරීමෙන් පසු 2021 ජුලි 09 දින සිට රෝහල් සේවා කටයුතු සඳහා ආරම්භ කළ හැකිව තිබුණු	ප්‍රතිකාර කටයුතු සඳහා අවශ්‍ය පරිදි වෛද්‍ය වෘත්තිකයින් රාජකාරියේ යෙදවූ අතර, රෝහල සතුව තිබූ වෛද්‍ය උපකරණ අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට	ඵලදායී ජාතික සෞඛ්‍ය කාර්යන් සඳහා යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට යොමු

	මහනුවර පල්ලේකැලේ රෝහල එදින සිට වර්ෂ තුනකුත් මාස 06 කට අධික කාලයක් රෝහල් කටයුතු සඳහා විවෘත කර නොතිබුණි.	ගෙන ඇති බව.	කළ යුතු වීම.
ii.	පැරණි රෝහලේ ඇඳන් භාවිත අනුපාතය හා අලුතින් ඉදිකළ නව රෝහල් පවතින ඇඳන් භාවිත අනුපාතය සසදා බැලීමේදි එය සියයට 4 ක් දක්වා ඉතා අවම මට්ටමක පවතින බවත්, වෛද්‍යවරුන් ඇතුළු 116 ක් වෛද්‍ය කාර්ය මණ්ඩලයෙන් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට අපෙක්ෂිත පරදි සැලසුම් සකස් කර නොතිබීම මත ඉදිකළ නව රොහලේ උපරිම ඵලදායීතාව ලභාකර ගැනීමට නොහැකි වී තිබුණි.	පෙර සේවයේ යෙදී සිටි අයට ප්‍රතිකාර ලබා දුන් අතර, නව රෝහලින් සේවයේ නියුතු, විශ්‍රාමික හා පවුල්වල සමාජිකයින්ට සේවා සැපයීම සිදු කරන බැවින් මෙම තත්ත්වය මඟ හරවා ගැනීමේ හැකියාව පවතින බව.	පවතින තත්ත්වයන් මනා ලෙස අධ්‍යනය කර සුදුසු සැලසුම් සකස්කර රෝහල ක්‍රියාත්මක කිරීම.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අවබෝධතා ගිවිසුමෙන් එකඟ වූ වාහන/උපකරණ හා අමතර කොටස් ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හා උපකරණ හා වාහන ධාවනයට සුදුසු තත්ත්වයේ නොමැති වීම නිසා එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වෙනුවෙන් 2024 වර්ෂයේ මුල් කාර්තු දෙකෙහි ඇ.ඩො මිලියන 2.68 ක ආදායමක් අහිමිවී තිබුණි.	මේ පිළිබඳව විස්තරාත්මක අධ්‍යනයක් සිදුකර ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	යථෝක්ත අවබෝධතා ගිවිසුමට අනුකූල වීම මඟින් ආදායම් අහිමි වීම වලක්වා ගැනීමට කටයුතු කිරීම.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2014 වර්ෂයේ වර්ග මීටර් 6,213.2 ක සිවුමහල් උත්සව ශාලා ගොඩනැගිල්ලක් පල්ලේකැලේ ප්‍රදේශයේ ඉදිකිරීමට සැලසුම් කර, 2019 වර්ෂය වන විට ඒ සඳහා රු.මිලියන 197.88 ක ශ්‍රම හා අනෙකුත් වියදම් රජයේ හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වලින් දරා තිබුණු අතර, පසුව එහි කොටසක් පල්ලේකැලේ යුද්ධ හමුදා රෝහල ලෙස සංවර්ධනය කර තිබුණද, මේ වන විටත් ඉදිකිරීම් අවසන්ව නොපැවති අතර ඉතිරි කොටසේ වැර ගැන්වූ කුළුනු කිහිපයක්ද පුපුරා ගොස් තිබුණි.	මෙම ගොඩනැගිල්ල යුද්ධ හමුදා රෝහලක් ලෙස පරිවර්ථනය කර ඇති අතර, අදාළ ඉරි තැලීම් ගොඩනැගිල්ලේ පැවැත්මට හානියක් නොවන බව.	ඵලදායී ජාතික ආර්ථික කටයුත්තක් වෙනුවෙන් යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම.

4.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් නවාතැන් පහසුකම්, කාර්යාල හා ගබඩා පහසුකම් සලසා ගැනීම සඳහා වාර්ෂිකව රු.මිලියන 172.03 ක් වැය කර ගොඩනැගිලි 22 ක් කුලී පදනම මත යුද්ධ හමුදාවට ලබාගෙන තිබුණු අතර, වර්ෂ 10 කට අධික කාලයක සිට කුලියට ගත් ගොඩනැගිලිද, ඒ අතර විය. රු.මිලියන 1,055.29 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල ආරම්භ කර ඇති කාර්යාලීය ගොඩනැගිලි, තට්ටු නිවාස, නිල නිවාස, බඩු ගබඩා, පොදු විනෝදාස්වාදය සඳහා වූ ගොඩනැගිලි, රෝහල් හා වෙනත් ඉදිකිරීම් 38 ක නිම කිරීමේ ප්‍රතිශතය සියයට 0 සිට සියයට 95 ක පරාසයක පැවතුණි.	අක්මුදල් නොලැබීම නිසා හටගත් තත්ත්වයන් බව.	අදාළ ව්‍යාපෘති වලින් සැලසුම් කළ ප්‍රගතිය වර්ෂය තුල ලබාගත යුතු වීම.

4.5 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරු ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ගොවිපලවල් පරිපාලනය තුළින් උපයන ලද රු.මිලියන 47.07 ක ශුද්ධ ලාභය අඩුවෙන්ද, සුභසාධන හෝටල් 04 ක සහ තල්සෙවන නිවාඩු නිකේතනයෙන් රු.මිලියන 53.9 උපයන ලද සම්පූර්ණ ශුද්ධ ආදායමද, 2024 වර්ෂයට අදලව යුද්ධ හමුදාව විසින් සකස් කර ඇති කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට මෙම වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	සත්‍ය තොරතුරු මත පදනම්ව වාර්ෂික කාර්ය සාධන වාර්තා නිවැරදිව සකස් කිරීම.

4.6 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි සීමිත/පාලිත ජාතික තරඟකාරී ක්‍රමය සහ ජාතික තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු රු.මිලියන 1,014.86 ක ප්‍රසම්පාදනවලදී ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙළ නොකිරීම, ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගැනීමේ ගැටළු, පිරිවිතර ලේඛන පිළියෙල කිරීමේ අඩුපාඩු හා පිරිවිතර නොඑකඟතා නොසලකා හැරීම, නියැදි ලබාගැනීම් ප්‍රමාදය, තාක්ෂණික ඇගයීම් කමිටු දින 30 සිට 192 ක් දක්වා ප්‍රමාද කර පත් කිරීම හා වාර්තා ලබා දීමට දින 96	ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව නිසි වගකීම් පැවරීම සිදුකර එසේ නොවන අවස්ථා හඳුනා ගැනීම හා විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු වීම.

සිට 368 ක් දක්වා ගත කිරීම, ඇණවුම නිකුත්කළ දින සිට භාණ්ඩ ගබඩාවට ලැබීමට දින 42 සිට 884 ක් දක්වා ගත වීම හා ගුණත්වයෙන් යුතු භාණ්ඩ නොලැබීමත් යන හේතු නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම හා ඵලදායිව සිදු කිරීමට නොහැකි වී තිබුණ අතර, උක්ත කරුණු හේතුවෙන් රු.මිලියන 176.54 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

4.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් වෙනත් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ වෙනත් ආයතනවලින් ට්‍රැක්ටර්, ට්‍රේලර්, ගිලන්රථ,කැබ් රථ, ජීප් රථ, ඉන්ධන බවුසර්, බස් රථ හා යතුරුපැදි ඇතුළු වාහන 73 ක් පරිහරණය කරමින් පවතින අතර, මෙම රථ අතුරින් 24 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අතර කාල පරිච්ඡේදයේදී සුදුසු ධාවන තත්ත්වයේ නොපවතින නිසා යුද්ධ හමුදා පරිශ්‍රයන්වල ගාල් කර තිබුණි.	මෙම වාහන පවරාගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන අදාළ ආයතන වෙතින් ලබාගැනීමට අවැසි ඉදිරි කටයුතු සිදුකර ඇති අතර, එම ලේඛන ලද පසු පවරා ගැනීමේ කටයුතු සිදුකිරීමට නියමිතව ඇති බව.	මෙම රථ වාහන විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතන වෙත මුදා හැරීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	යුධ සමයේ අත්පත් කර ගත් වාහන 547 ක් අතුරින් වාහන 454 සඳහා රක්ෂණ ආවරණ ලබා ගෙන නොමැති අතර, වාහන 221 ක් 2024 වර්ෂය තුළ කිසිදු කටයුත්තක් සඳහා භාවිතා නොකර යුද්ධ හමුදා පරිශ්‍රයන්හි ගාල්කර තිබුණි.	අනෙකුත් යුහ වාහන වෙනුවෙන් රක්ෂණ ආවරණ ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදුකර ඇත.	රක්ෂණාවරණ ලබා ගැනීමට හා නිසි රක්ෂණාවරණයක් නොමැතිව වාහන ධාවනය කිරීම පිළිබඳ සුදුසු පියවර ගැනීම.
(ඇ)	පුත්තලම ආධුනික පුහුණු මධ්‍යස්ථානය මඟින් සේවාස්ථ පුහුණු කටයුතු සිදු කිරීම යුද්ධ හමුදාවේ ප්‍රමුඛ කාර්යක් වුවත් සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව පරීක්ෂාවේදි එම පුහුණු මධ්‍යස්ථානය පුහුණු කටයුතු සඳහා උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ඉදිරිපත් කිරීමට නොහැකිවී ඇත.	කාර්යසාධන වාර්තාව නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
(ඈ)	යුද්ධ හමුදාව විසින් පාලනය කරනු ලබන ගොවිපලවල් 12 ක් සහ සුහසාධන හෝටල් 03 ක් පවත්වාගෙන යනු ලබන අක්කර 4096.49 ක ඉඩම් විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලට අයත් වන අතර, එම ඉඩම් නිරවුල් කර යුද්ධ හමුදාව නමින් පවරා ගනිමින් අදාළ ව්‍යාපෘති	මෙම ඉඩම් අක්කර 4000.89 නිරවුල්කර යුද්ධ හමුදාව නමින් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.	කඩිනමින් ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

	පවත්වාගෙන යාම කෙරෙහි යුද්ධ හමුදාව අවධානය යොමුකර නොතිබුණි.		
(ඉ)	සාම සාධක රාජකාරීන් සඳහා අනුයුක්ත කර ඇති භට පිරිසක් සඳහා 2016 වර්ෂයේ සිට මිලදී ගෙන තිබුණු රු.මිලියන 68.34 ක් හා ඇ.ඩො.138,181.13 වටිනා අත්‍යවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව දිවයිනේ විවිධ ප්‍රදේශවල ගබඩා කර තිබුණි.	සාමසාධක තොගයේ පවතින විෂයන් යුද්ධ හමුදා තොගයට ලබාගෙන අවශ්‍යතාවය අනුව නිකුත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව.	මිලදීගෙන ඇති මෙම රථ හා උපකරණ රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළ යුතු වීම.
(ඊ)	පල්ලෙකැලේ රෝහල සඳහා මිලදී ගෙන තිබුණු රු.මිලියන 841.63 ක වටිනාකමක් ඇති විදුලි, වෛද්‍ය, මුළුතැන්ගේ, ගෘහභාණ්ඩ ඇතුළු විවිධ උපකරණ ද සවිකිරීම් සහ ගොඩනැගිලි යටිතල පහසුකම් ද ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණු අතර, ඉන් රු.මිලියන 272.01 ක වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. තවද, උක්ත වටිනාකම තුළ ඇතුළත් රු.මිලියන 124.4 ක් වැයකර මිලදී ගෙන තිබුණු උපකරණ අයිතම 262 ක සහ යටිතල පහසුකම් පද්ධතිවල නිදහස් වගකීම් කාලය අවසන් වී වසර තුනකට ආසන්න කාලයක් ගත වී තිබුණු අතර, එම කාලය තුළ මෙම වත්කම් ඌණ උපයෝජිතව පැවතීම නිසා එම වැයකල මුදලින් නිසි ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	රෝගීන් හා විශේෂඥ වෛද්‍යවරුන් නොමැති වීමෙන් භාවිතයට නොගෙන වගකීම් කාලසීමාව අවසන් වී ඇති අතර, සියළු උපකරණ පුහුණු කාර්මිකයින් යොදවා සතිපතා සේවා සිදුකර ඇති බව හා තොග ගත නොකරන ලද වත්කම් අධීක්ෂණ නිලධාරියකු යටතේ නඩත්තු කරන අතර, වත්කම් ලේඛනයට ඇතුළත් කර නොමැති වත්කම් කඩිනමින් ලේඛනගත කරන බව.	ඵලදායී ආර්ථික කටයුත්තක් වෙනුවෙන් යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට හා උපකරණ නිවැරදිව තොගගත කර, නිසි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු වීම.
(උ)	කටුබැද්ද ශ්‍රීලවියාඉ මූලික වැඩපල පරිශ්‍රයේ පැවති ප්‍රයෝජනයට ගත නොහැකි අමතර කොටස් වර්ග 107 ක ඒකක 12,938 ක ප්‍රමාණයක් 2024 පෙබරවාරි 26 දින නිකුත් කර ඇති වාර්ෂික අයෝග්‍ය කිරීමේ මණ්ඩල වාර්තා මඟින් අයෝග්‍ය කිරීමට නිර්දේශකර තිබුණද ඒ අනුව කටයුතු කර ආදායම් උපයා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	පාවිච්චියට නුසුදුසු අමතර කොටස් වාර්ෂිකව සිදුකරනු ලබන අයෝග්‍ය කිරීමේ මණ්ඩල වෙත ඉදිරිපත් කර අවැසි ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	ඵලදායී නොවන අමතර කොටස් කඩිනමින් අපහරණය කර ආදායම රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම.
(ඌ)	යුද්ධ හමුදාව විසින් භාවිතා කරන ලද විවිධ වර්ගයේ හිස් පතොරම් 65,564 ක ප්‍රමාණයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් හා අනුමැතිය මත ඉතිරි පතරොම් කොපු සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව.	ආරක්ෂිතව අපහරණය කිරීමට ක්‍රියාකළ යුතු වීම.

4.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සලාක හා ඉන්ධන අක්‍රමිකතාවයන් ආශ්‍රිත සිද්ධීන්, රිය අනතුරු සිද්ධීන්, ත්‍රස්තවාදී ප්‍රහාර ආශ්‍රිත සිද්ධීන් හා ත්‍රස්තවාදී නොවන හේතූන් මත ඇති වූ අලාභ හානි සිද්ධි වලින් වසර 10 කට වැඩි සිද්ධි 97 ක් ඇතුළුව මුළු සිද්ධි 315 කට එකතුව රු.මිලියන 13.263 ක අලාභයක් පැවතුණි.	අලාභ හානි 51 ක් නිරවුල් කර ඇති අතර, අනෙකුත් පාඩු හානි නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ඉතිරි අලාභ හානි අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු වීම.

4.9 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සැපයුම්කරුවකු සමඟ රු.මිලියන 233 ක් වටිනා Cloth Cotton Dril Olive Green 58/66" වර්ගයේ රෙදි මීටර් 142,000 ක් මිලදී ගැනීම සඳහා 2022 සැප්තැම්බර් 15 හා දෙසැම්බර් 30 දිනයන්හි ගිවිසුම්ගත වී තිබුණු අතර, සැපයුම්කරු 2024 පෙබරවාරි හා මාර්තු මාසයන්හි රෙදි මීටර් 134,783 ක් සපයා තිබුණද, අදාළ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වීමේ කාරක ප්‍රාග්ධන පාඩු අයකර ගැනීමට හා අදාළ සැපයුම්කරු අසාදුලේඛන ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	යුධ හමුදාව වෙත සිදුවූ පාඩුව පියවීම වෙනුවෙන් රු.මිලියන 23.30 ක කාර්ය සාධන ඇපකරයන් අය කරගෙන ඇති බව.	ගිවිසුම් ප්‍රකාර සැපයුම් සිදු නොවී කඩවීමේ අලාභය අයකිරීමට කටයුතු කිරීම.
(ආ)	මාසික කුලී වාහනයක් භාවිතා කළ හැකි සාමාන්‍ය කි.මී ප්‍රමාණයට වඩා අඩු කි.මී ප්‍රමාණයක් උපයෝජනය කර ඇති වාහන වෙනුවෙන්, කි.මී. කට රු.16 ක අපේක්ෂිත කුලිය සඳහා කි.මී.කට රු.47 සිට රු.63 දක්වා විශාල පිරිවැයක් දරා තිබුණු අතර, වාහන හයක සක්‍රීය මයිලෝ මීටර් අනුව ධාවනය කළ දුර ප්‍රමාණයට වඩා කි.මී 31,882 ක් සඳහා වැඩිපුර ඉන්ධන ලීටර් 3,751 ක් භාවිතා කර තිබුණි.	ඉදිරියේදී වාහන බිල්පත් නිරවුල් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය යලි සමාලෝචනය කරනු ලබන බව.	වාහන කුලී හා ඉන්ධන වියදම කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමයක් සකස් කිරීම.
(ඇ)	තුර්කි රාජ්‍යයේ හදිසි ආපදා තත්ත්වය සඳහා සහන කණ්ඩායම් සඳහා රු මිලියන 15.92 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීමේදි තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබුණු අතර, ඉන් ඇණවුම ලබා දීමට පෙර සැපයුම්කරුවන් විසින් රු.මිලියන 11.34 ක් වටිනා භාණ්ඩද සැපයුම් කර තිබුණු අතර, රු.මිලියන 9.09 ක් වටිනා භාණ්ඩ අදාළ සංචාරය අවලංගු කර තිබියදී මිලදී ගෙන තිබුණි.	අදාළ සංචාරය අවලංගුවීම හේතුවෙන් මෙම භාණ්ඩ විවිධ බල ප්‍රදේශයේ සේවයේ නියුතු අයවළුන්ට වාර්ෂික අවශ්‍යතාවය සඳහා නිකුත් කිරීමට කටයුතු කර ඇති බව.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කිරීම.

4.10 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

යුද්ධ හමුදාව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් හා තොරතුරු කැඳවීම් සඳහා නියමිත කාළය තුල පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි.

	විගණන විමසුම පිළිබඳ විස්තරය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 30 දින හා 2025 මැයි 22 දින නිකුත් කරන ලද විගණන විමසුම් අංක DEF/A/SLA/2024/18 හා DEF/A/SLA/2024/34 යන විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	DEF/A/SLA/2024/18 සඳහා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලිපියක් ලබා දී ඇති බව.	විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු ලබා දීම.
(ආ)	සමාලෝචිත වර්ෂයේ බැරකම්වලට අදාළව සැපයුම්කරුවන් 14 දෙනෙකුගේ රු.මිලියන 1,798 ක ශේෂයන් සනාථ කර ගැනීම සඳහා එම ආයතනවලට අදාළ ලිපිනයන්, දුරකථන අංක හා විද්‍යුත් තැපැල් ලිපිනයන් පිළිබඳ තොරතුරු යුද්ධ හමුදාවෙන් ඉල්ලුම් කලද එම තොරතුරු නියමිත දිනට ලබා නොදීමෙන් බැරකම් ශේෂ තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.	කෙටුම්පත් වාර්තාවේ පිළිතුරු සමඟ ඉදිරිපත් කර ඇති බව.	නියමිත දිනට තොරතුරු ඉදිරිපත් කළ යුතුවීම.

4.11 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මොටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව යුද්ධ හමුදාධිපති නමින් ලියාපදිංචි වාහන 6,751 ක් පැවතියද, යුද්ධ හමුදාව විසින් වර්තමානයේ පරිහරණය කරනු ලබන හා භාවිතා නොකරන වාහන 6,476 ක් පවතින අතර, ඒ අනුව වාහන 275 ක වෙනසක් පැවතුණි.	මෙම වෙනස වර්ෂය තුළ නිවැරදිකර ගැනීමට අදාළ කටයුතු මේවන විටත් සිදුකරමින් පවතින බව.	යුද්ධ හමුදාව සතු වාහන හා ලියාපදිංචි වාහන අතර වෙනස නිරවුල් කළයුතු වීම.
(ආ)	යුද්ධ හමුදාවට අයත් කුණ්ඩසාලේ පිහිටි පර්චස් 68.4 ක භූමි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් 2007 වර්ෂයට පෙර සිට අත්පත්කරගෙන පරිහරණය කරනු ලබන අතර මෙම ඉඩම් නිරවුල් කර යුද්ධ හමුදාවට පවරා ගැනීමට අදාල කටයුතු කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් එක්ව නිරවුල් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	යුද්ධ හමුදාවට අයත් භූමිය කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ඈ)	ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන 387 ක් අලුත්වැඩියා කර භාවිත කිරීමට හෝ අපහරණය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහන 47 ක් පමණක් මේ වන විට අලුත්වැඩියා සඳහා වැඩපල වෙත භාරදී ඇති බව.	වාහන නියමිත පරිදි අලුත්වැඩියා කර පරිහරණය කිරීම හෝ අපහරණය කිරීම.
(ඇ)	ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා අදාළ වියදම් නිවැරදි ගිණුම් පොත්පත්, වාර්තා සහ සටහන් පවත්වාගෙන යාම මෙන්ම ආදායම් සඳහා රිසිට්පත් නිකුත් කිරීමේ සිට බැංකුගත කිරීම දක්වා අදාළ අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක වන බවට පරීක්ෂාවන් සිදුකළ බවට අනාවරණය නොවුණි.	ගිණුම් ප්‍රධාන අභ්‍යන්තර විගණක සහතික කිරීමෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව.	ආදායම් නිශ්චිත පරිදි හඳුනාගෙන, ගිණුම්ගත කර, භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතු වීම.
(ඉ)	වේරහැර යුද්ධ හමුදා රෝහල තුළ පිහිටි ඖෂධ ගබඩා ගොඩනැගිල්ල සෞඛ්‍ය අමාත්‍යාංශ සහ ඖෂධ නියාමන අධිකාරියේ හා අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව සකස්කර නොතිබුණු අතර, ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර 2021 ජුලි 04 දින රු.මිලියන 10.3 ක පිරිවැයක් දරා අත්තිවාරම් දැමීමට හා 2024 වර්ෂයේ රු.මිලියන 31.9 ක වියදමක් දරා ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද, මෙම ගබඩාව ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය අවසන් දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 50%ක් වන අතර, ඉතිරි ප්‍රතිපාදන ව්‍යාපෘතිය වෙත ලැබීමෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව.	සැලසුම් කළ පරිදි ගොඩනැගිල්ල ඉදිකර, ආරක්ෂිතව ඖෂධ ගබඩා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගත යුතු වීම.
(ඊ)	රජයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් මිලදී ගත් පිරිවැය රු.මිලියන 9.59 ක් වටිනා ඖෂධ වර්ග 80 ක් භාවිතයෙන් ඉවත් කර සහ තාවකාලිකව අත්හිටුවා ඇති අතර, එම පිරිවැය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, ඉන් රු.මිලියන 6.4 ක් වටිනා ඖෂධ පුළුස්සා දමා තිබුණි. ඉතිරි ඖෂධ සහ ආධාර වශයෙන් ලද ඖෂධ වටිනාකම තහවුරු කරගත නොහැකි අතර ඖෂධ අදාළ අරමුණු වෙනුවෙන් නිකුත් නොකිරීම හේතුවෙන් කල් ඉකුත්වී තිබුණි. එම සියළු ඖෂධ ගබඩාවේ අනෙකුත් ඖෂධ සමඟ අවිධිමත්ව ගොඩගසා තිබුණි.	වෛද්‍ය සැපයුම් අංශය මඟින් එම ඖෂධ කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරන බව හා කෙටි කාල සීමාවක් තුළ කල් ඉකුත් වීමට ආසන්න ඖෂධ නිකුත් කිරීමට කටයුතු කර ඇති බව.	ඖෂධ ගබඩා කිරීම පිළිබඳ රජයේ මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වීම.
(උ)	පිරිවැය රු.මිලියන 20.10 ක් වැයකර 2023 වර්ෂයේ මිලදී ගත් Heavy Duty Photocopy Machine 20 ක ප්‍රමාණය ඌණ උපයෝජිත තත්ත්වයේ පවතින අතර, මෙම යන්ත්‍ර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.	මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදී ඇති බැවින් පිටපත් ලබා ගැනීම අවම වී ඇති බව.	ඵලදායී ලෙස සම්පත් උපයෝජනය කිරීම.

(ඐ)	රු.මිලියන 101.14 වැයකර Oracle - 19c පරිගණක මෘදුකාංග බලපත්‍රය මිලදී ගැනීමේදි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ජාතික තරඟකාරි ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය නොකර ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම හේතුවෙන් රු.මිලියන 26.3 ක් වැඩපුර ගෙවා මිලදී ගෙන තිබුණි.	2024 හි සඳහන් උපදෙස් පරිදි ජාතික තරඟකාරී මිල කැඳවීම් යටතේ මෙවැනි ප්‍රසම්පාදනයන් සිදුකරනු ලැබේ.	ප්‍රසම්පාදන මාරගෝපදේශ සංග්‍රහය අනුව කටයුතුකළ යුතු වීම.
(එ)	ඖෂධ කළමණාකරණ අත්පොතෙහි 5 වන පරිච්ජේදය 2 වන ජේදය ප්‍රකාරව අවම වශයෙන් මාසයක් හෝ මාස දෙකක කාලයක් සඳහා ප්‍රමාණවත් තොග පවත්වා ගතයුතු වුවත්, යුද්ධ හමුදාව විසින් 2024 වර්ෂයේ දී ප්‍රසම්පාදනයන් මඟින් මිලදී ගැනීමට සැලසුම් කල ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය තොග 1629 ක් 2024 නොවැම්බර් 20 දින වනවිට ශුන්‍යව පැවතුණි.	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 50 ක් පමණක් මිලදී ගැනීමට කටයුතු කළ බව.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කළ යුතු වීම.
(ඒ)	හමුදා නොවන පාඨමාලා සඳහා යුද්ධ හමුදාව වෙතින් ලබාදී ඇති රු.මිලියන 35.99 ක (සියයට 60 ක) මුදල, එම පාඨමාලාව සම්පූර්ණ නොකරන ලද නිලධාරීන්ගෙන් නැවත අයකර ගෙන නොතිබුණි.	තව දුරටත් රු. මිලියන 24.27 ක් අයකර ගැනීමට පවතින බව.	කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරීම.
(ඔ)	2006 වර්ෂයේ නිකුත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධානි, මෙහෙයුම් අධ්‍යක්ෂ සහ ක්ෂේත්‍ර රාජකාරි සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ හෝ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් යොදාගත හැකි බව දක්වා තිබුණද, යුද්ධ හමුදාවේ නිලධාරින් 15 දෙනෙකු සහ සෙසු නිලයින් ක්ෂේත්‍ර නොවන රාජකාරි සඳහා යොදවාගෙන තිබුණු අතර, මෙම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන ලීටර් 21,520 ක් ලබා දී තිබුණි.	ලබාදී ඇති උපදෙස් වලට පටහැනිව රාජකාරී සඳහා අනුයුත්ක නොකරන ලෙසටත්, වෙනත් රාජකාරි සඳහා යෙදවීමට අමාත්‍යාංශ අනුමැතිය පිළිබඳ විමසීම් කරන බව.	අදාළ අමාත්‍ය මණ්ඩළ සංදේශ ප්‍රකාරව කටයුතු කිරීම.
(ඕ)	2023 ජූලි මාසයේ සිට 2024 ජුනි මාසය දක්වා යුද්ධ හමුදාව විසින් විදුලි බිල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු. මිලියන 9.58 ක අධිභාර ගෙවීමට සිදු වී තිබුණි.	ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව ලබාගනිමින් ගෙවීමට කටයුතු කරන බව.	බිල්පත් නියමිත දිනට ගෙවීමට කටයුතු කිරීම.

5. **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශිය විදුලිය නිපදවීම වෙනුවෙන් දායක වීම, කාර්යක්ෂම වෛද්‍ය සේවයක් පවත්වාගෙන යාම, යුද්ධ හමුදාව ආවරණය වන පරිදි බෝවන/ බෝනොවන රෝග පිළිබඳ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් පැවැත්වීම, ගජසිංහ පුර ආරක්ෂිත පස්බැමි, වෙඩිද්‍රව්‍ය ගබඩාවන් වටා පස් පිරවීම සහ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සැකසීම, අක්කර 278.62 ක ප්‍රමාණයක කැලෑ ප්‍රදේශ එළි පෙහෙළි කිරීම හා රථවාහන අනතුරු තුළින් දෛනිකව සිදුවන ජීවිත හා දේපල හානි අවමකර ගැනීම සඳහා දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම යන ඉලක්කයන් වෙත සමාලෝචිත වර්ෂයේදී ළඟාවීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	ඇතැම් අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපෘති අවසන් අදියරේ පවතින බවත් ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කාල පමාවක් පවතින බව.	තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම.

6. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යුද්ධ හමුදා කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 59,761 ක් හා සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්විතීක ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2,936 ක් ලෙස සමස්ථ පුරප්පාඩු 62,697 ක් පැවතුණි.	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පරිදි තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව.	පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැළපෙන ලෙස සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම.
(ආ)	2021 මැයි 20 දින සිට සිවිල් පරිපාලන අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතින අතර, මේ සඳහා ස්ථිර නිලධාරියකු පත්කිරීමට විගණිත දිනය දක්වාත් කටයුතු කර නොතිබුණි.	පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් සබැඳිව කටයුතු කරන බව.	අදාළ පුරප්පාඩුව කඩිනමින් සම්පූර්ණ කළ යුතු වීම.
(ඇ)	2016 ජුනි 24 දින පැවති රජයේ ගිණුම් කාරක සභාවේ නිර්දේශය ප්‍රකාරව සිවිල් නිලධාරීන්ගෙන් සැදුම්ලත් ස්වාධීන අභ්‍යන්තර විගණන ඒකකයක් 2017 වර්ෂයේ ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් හා ස්වාධීනභාවයක් ලබා දීම තුළින් රජයේ ගිණුම් කාරක සභාවේ අපේක්ෂාවන් ඉටුකර ගැනීමේ හැකියාව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීමට කළමණාකරණ සේවා දෙපාර්තමෙන්තුව හා එක්ව ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	රජයේ ගිණුම් කාරක සභාවේ අභිමතාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතු වීම.